# ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

# කාර්ය මණ්ඩල ඇබෑර්තු

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය (CAASL) මතා ලෙස ස්ථාපිත නියාමන කාර්ය රාමුවක් තුළ උපාය මාර්ගික සැලසුම්, වෘත්තීය මාර්ගෝපදේශ හා දැඩි ආවේක්ෂණයක් තුළින්, ජාතික නීතිකාරක අවශ්‍යතා සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් හා නිර්දේශිත පරිචයන් (SARPs) අනුගත වන ආරක්ෂාකාරී, ප්‍රවේශ සහිත, කාර්යක්ෂම, ක්‍රමාණුකූල හා පරිසර හිතකාමී ජාතික සිවිල් ගුවන් සේවා පද්ධතියක් මෙහෙයවීම සහතික කරනු ලබයි. ඒ අනුව ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය වෙත තම ආයතනයේ පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා, සිවිල් ගුවන් සේවා ක්ෂේත්‍රයේ ඉහළ සුදුසුකම් හා පෘථුල පළපුරුද්ද සහිත උද්යෝගී, දැඩි උනන්දුවක් සහිත හා ස්වයං උද්යෝගී අයවලුන් අවශ්‍යව ඇත.

## අධ්‍යක්ෂ (මූල්‍ය හා ආදායම් කළමනාකරණ)

## තනතුරු කේතය : HM-1-1-D10 තනතුරු ගණන - 01

**ලබාදීමට නියමිත වැටුප් :** (වැටුප පරිමාණය (HM 1-1) - රුපියල් 80,295 -15X2,270 - 114,345 - MS චක්‍රලේඛ 02/2016(I) ප්‍රකාරව)

- සියලු දීමනා ඇතුළත්ව හිමිවන මාසික වැටුප දළ වශයෙන් රුපියල් 173,595.00 වන අතර, එයට, මූලික වැටුප, ජීවන අංක දීමනාව, වෘත්තීය දීමනාව, මාසික දීමනාව, අන්තර් දීමනාව හා ප්‍රවාහන දීමනාවද අදාළ චක්‍රලේඛ ප්‍රකාරව අයත් වේ.
- ඉන්ධන දීමනාව, මසකට ලීටර් 115 වටිනාකමට හිමිය. (අදාළ අවස්ථාවේ පවත්නා මිලට) .
- වෙනත් ප්‍රතිලාභ : සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය, හදිසි අනතුරු රක්ෂණ යෝජනා ක්‍රමය, මරණ ප්‍රදාන යෝජනා ක්‍රමය, ලබා නොගත් නිවාඩු සඳහා ගෙවීම්, ජංගම දුරකථන බිල්පත් ප්‍රතිපූරණය, ප්‍රසාද දීමනා.

**සුදුසුකම් හා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන්**

1. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වසර තුනක (03), ගණකාධිකරණය, වාණිජ්‍යය, කළමනාකරණය හෝ පරිපාලනය ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක්;

සමග

2. මූල්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි (මාස්ටර්ස්) සුදුසුකම් හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය;

සහ

3. සංස්ථාවක/ ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක / රජයට අයත් සමාගමක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක මූල්‍ය කළමනාකරණ ක්ෂේත්‍රය හෝ විගණන ක්ෂේත්‍රයේ කළමනාකරණ තලයේ අවම වසර දහයක (10) පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**1. වන මනාපය**

ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් සපුරා තිබීම.

**2. වන මනාපය**

පහත සඳහන් කරුණු සපුරා තිබීම.

1. මූල්‍ය කළමනාකරණ හෝ විගණන ක්ෂේත්‍රයේ කළමනාකරු වර්ගීකරණයේ (MM1-1) 1 ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම;
2. පසුගිය වසර පහක (05 කාලයක් නිකැලැල් සේවා වාර්තාවක් පවත්වා ගෙන තිබීම හා වර්තමාන තනතුරට අදාළ සියලුම වැටුප් වර්ධක ලබා තිබීම;
3. පසුගිය වසර පහ (05) තුළ වාර්ෂික කාර්ය සාධන ඇගයීම් සඳහා "හොඳයි" හෝ ඉන් ඉහළ ශ්‍රේණියක් ලබා තිබීම.

## ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන් සේවා පරීක්ෂක (පිරිස් බලපත්‍රකරණ පරීක්ෂණ හා ප්‍රමිතීන්)

## තනතුරු කේතය : MM-1-1-PL1 තනතුරු ගණන - 01

ලබාදීමට නියමිත වැටුප : (වැටුප් පරිමාණය (MM1-1) රුපියල් 53,175 - 10X1,375 - 15X1,910- 95,575 - MS චක්‍රලේඛ 02/2016 ප්‍රකාරව)

- සියලු දීමනා සහිත මාසික වැටුප දළ වශයෙන් රුපියල් 143,475.00 වන අතර, එයට මූලික වැටුප, ජීවන අංක දීමනාව, මාසික දීමනාව, අන්තර් දීමනාව හා කළමනාකරු දීමනාවද, අදාළ වන චක්‍රලේඛ ප්‍රකාරව අයත් වේ.
- අදාළ අවශ්‍ය සුදුසුකම් සහිත සාර්ථක අයදුම්කරුවන්හට දළ වශයෙන් රුපියල් 85,000.00 ක විශේෂ තාක්ෂණික දීමනාවක් ගෙවනු ලැබේ.
- අනෙකුත් ප්‍රතිලාභ: සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය, හදිසි අනතුරු යෝජනා ක්‍රමය, මරණ ප්‍රදාන යෝජනා ක්‍රමය, ප්‍රසාද දීමනා, ලබානොගත් නිවාඩු සඳහා මුදල් ගෙවීම හා ජංගම දුරකථන බිල්පත් සඳහා ප්‍රතිපූරණය.

**සුදුසුකම් හා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන්**

**1 වන මනාපය**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වසර තුනකට (03), නොඅඩු භෞතික විද්‍යාව, ප්‍රවාහනය, ගගනික කර්මාන්තය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හෝ ඉංජිනේරු ධාරාව ක්ෂේත්‍රවල ප්‍රථම උපාධියක් සමග ගුවන් සේවා ක්ෂේත්‍රයේ නියුතු රජයේ දෙපාර්තමේන්තුවක/ රාජ්‍ය ව්‍යවසායක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක වසර අටකට (08) නොඅඩු පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**2 වන මනාපය**

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක අන්තර්මධ්‍ය විභාගය සමත් වීම සමග ගුවන් සේවා ක්ෂේත්‍රයේ නියුතු රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය ව්‍යවසායකයක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක විධායක තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වසර අටක (08) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**3 වන මනාපය**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම් 7 තලයට නොඅඩු අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සමග ගුවන් සේවා ක්ෂේත්‍රයේ නියුතු රජයේ දෙපාර්තමේන්තුවක/ රාජ්‍ය ව්‍යවසායකයක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක විධායක තනතුරක අවම වසර අටක (08) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**1. වන මනාපය**

ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් සපුරා තිබීම.

**2. වන මනාපය**

සිවිල් ගුවන් සේවා පරීක්ෂක (පිරිස් බලපත්‍රකරණය - පරීක්ෂණ) සිවිල් ගුවන් සේවා පරීක්ෂක (පිරිස් බලපත්‍රකරණය - ප්‍රමිතීන්), සිවිල් ගුවන් සේවා පරීක්ෂක (පියසර කාර්ය මණ්ඩලය) සිවිල් ගුවන් සේවා පරීක්ෂක (පිරිස් බලපත්‍රකරණය - පියසර නොවන කාර්ය මණ්ඩලය), සිවිල් ගුවන් සේවා පරීක්ෂක (පියසර පුහුණු) තනතුරක, අදාළ වන පරිදි, අවම වශයෙන් වසර හයක (06) සේවා පළපුරුද්ද;

**සහ**

සහ පසුගිය වසර හයක (06) කාලය තුළ නිකැලැල් සේවා වාර්තාවක් පවත්වා ගැනීම සහ වර්තමාන තනතුරට අදාළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබීම;

**සහ**

පිරිස් බලපත්‍රකරණ කටයුතු ක්ෂේත්‍රයේ සති හතරකට (04) නොඅඩු කාලයක, ICAO ආයතනය විසින් අනුමත කළ පුහුණු පාඨමාලා සාර්ථකව සම්පූර්ණ කොට තිබීම.

**සහ**

වාර්ෂික කාර්ය සාධන ඇගැයුම් වලින් "හොඳයි" හෝ ඉන් ඉහළ ශ්‍රේණියක් ලබා තිබීම.

**වයස් සීමාව**

| තනතුර | වයස් සීමාව | සැලකිය යුතු කරුණු |
| --- | --- | --- |
| අධ්‍යක්ෂ | අවුරුදු 35 - 55 අතර | මෙම ඉහළ වයස් සීමාව, අභ්‍යන්තර අයදුම්කරුවන් හා ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම, දේශීය ගුවන් සේවා හෝ පියසර පාසල්වල සේවයේ නියුතු අය හට අදාළ නොවේ. |
| ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන් සේවා පරීක්ෂක | අවුරුදු 22 - 45 අතර | |

- අවශ්‍ය වැඩිදුර විස්තර, රැකියා විස්තර, විශේෂ තාක්ෂණ දීමනාව සඳහා අවශ්‍යතා සහ සම්මත අයදුම්පත CAASL නිල වෙබ් අඩවිය වන www.caa.lk වෙතින් බාගත කළ හැක.
- අයදුම්කරුවන් විසින් අයදුම් කළ තනතුරු / තනතුර සඳහා තම සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කිරීම සඳහා අවශ්‍ය ලේඛනවල පිටපත් එවිය යුතුය.
- සම්මත අයදුම්පත් ආකෘති පත්‍ර මගින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් පමණක් භාරගනු ලැබේ. රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානී මගින් යොමු කළ යුතුය.
- යථා පරිදි සම්පූර්ණ කළ අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් හෝ ඊමේල් employment@caa.lk මගින් එවීමෙන්, 2024.05.27 දිනට පෙර මෙම කාර්යාල වෙත ලැබීමට සැලැස්විය යුතු අතර, ඒවා ලැබුණු බවට දැනුම් දෙනු ලැබේ.
- අයදුම්පත්, සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරී ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය අංක 152/1, මිනුවන්ගොඩ පාර, කටුනායක යන ලිපිනයට යොමුකළ යුතු අතර, අදාළ අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.
- සුදුසුකම් නිර්ණායක සතුටුදායක ලෙස සම්පූර්ණ කරනු ලබන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ/ විභාග සඳහා කැඳවනු ලැබේ.

**සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරී**
**ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය,**
**අංක 152/1, මිනුවන්ගොඩ පාර, කටුනායක.**
**2024.05.14**